අග්‍රාමාත්‍යතුමා ජාතිය අමතා සිදු කළ කතාව

2025 මැයි 12

මා හිතවත් රටවැසියනි, නමස්කාර්!

පසුගිය දින කිහිපය තුළ අප සැම අප රටේ ශක්තිය සහ ඉවසීම දුටුවා. පළමුව, ඉන්දීය ජනතාව වෙනුවෙන්, මා ඉන්දියාවේ නිර්භීත බලකායන්ට, සන්නද්ධ හමුදාවන්ට, අපගේ බුද්ධි අංශයන්ට සහ අපගේ විද්‍යාඥයන්ට මාගේ ආචාරය පුද කරනවා. අපගේ නිර්භීත සබෙළුන් සින්දූර් මෙහෙයුමේ අරමුණු ළඟා කර ගැනීම සඳහා සුවිසල් ධෛර්යයක් පෙන්නුම් කළා. මම ඔවුන්ගේ නිර්භීතභාවයට, ධෛර්යයට සහ වීරත්වයට උත්තමාචාරය පුද කරනවා. මා මෙම වීරත්වය රටේ සියලු මව්වරුන්ට, සහෝදරියන්ට සහ දියණියන්ට කැප කරනවා.

මිත්‍රවරුනි,

අප්‍රේල් 22 වන දින පහෙල්ගම් හිදි ත්‍රස්තවාදීන් විසින් පෙන්නුම් කරන ලද ම්ලේච්ඡත්වය මුළු රට සහ ලෝකය කම්පනයට පත් කර තිබෙනවා. අහිංසක පුරවැසියන් ඔවුන්ගේ ආගම මත පදනම්ව ඔවුන්ගේ පවුලේ අය සහ දරුවන් ඉදිරියේ අනුකම්පා විරහිත ලෙස මරා දැමීම ත්‍රස්තවාදයේ සහ කෲරත්වයේ ඉතා බිහිසුණු මුහුණුවරක්. මෙය රටේ සමඟිය සහ එකමුතුභාවය බිඳ දැමීම සඳහා ගන්නා ලද පිළිකුල් සහගත උත්සහයක් ද වෙනවා. මට පෞද්ගලිකව මෙය ඉතා වේදනාකාරියි. මෙම ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් අනතුරුව මුළු ජාතියම, සෑම පුරවැසියෙකුම, සෑම ප්‍රජාවක්ම, සෑම පන්තියක්ම, සෑම දේශපාලන පක්ෂයක්ම ත්‍රස්තවාදයට එරෙහි ශක්තිමත් ක්‍රියාමාර්ග සඳහා එක්සත්ව නැගී සිටියා. අප ත්‍රස්තවාදීන් අතුගා දැමීම සඳහා ඉන්දීය හමුදාවන්ට සම්පූර්ණ නිදහස ලබා දුන්නා. අද දින සෑම ත්‍රස්තවාදියෙකුම, සෑම ත්‍රස්ත සංවිධානයක්ම අපගේ සහෝදරියන්ගේ සහ දියණිවරුන්ගේ නළලතින් සින්දූර් මකා දැමීමේ ප්‍රතිවිපාක දන්නවා.

මිත්‍රවරුනි,

සින්දූර් මෙහෙයුම යනු හුදු නමක් පමණක් නොවේ. එය රටේ මිලියන සංඛ්‍යාත ජනතාවගේ හැඟීම්වල පිළිඹිබුවක්. සින්දූර් මෙහෙයුම, යුක්තිය උදෙසා අපගේ අප්‍රතිහත කැපවීමයි. මැයි 6 වන දින රාත්‍රියේ සහ මැයි 7 වන දින අලුයම මුළු ලෝකයම මෙම ප්‍රතිඥාව යථාර්ථයක් වනු දුටුවා. ඉන්දීය හමුදාවන් පාකිස්ථානයේ ත්‍රස්ත තිප්පොළවල් සහ ඔවුන්ගේ පුහුණු මධ්‍යස්ථාන වෙත නිරවද්‍යතාවයෙන් යුත් ප්‍රහාර එල්ල කළා. ඉන්දියාව එවැනි විශාල තීරණයක් ගනු ඇතැයි ත්‍රස්තවාදීන් කිසිදින සිතුවේ නැහැ. නමුත් රට එක්සත්ව සිටින විට, ජාතිය පළමුව තබා කටයුතු කරන විට සහ ජාතික අභිලාෂය අතිශය වැදගත් වන විට ශක්තිමත් තීරණ ගෙන ප්‍රතිඵල ළඟා කර ගැනෙනවා.

ඉන්දියාවේ මිසයිල සහ ඩ්‍රෝන පාකිස්ථානයේ ත්‍රස්තවාදී කඳවුරු වෙත ප්‍රහාර එල්ල කරන විට ත්‍රස්තවාදී සංවිධානවල ගොඩනැඟිලි පමණක් නොව ඔවුන්ගේ ධෛර්යය ද දරුණු ලෙස සුණු විසුණු වී ගියා. බහාවල්පූර් සහ මුරිඩ්කේ වැනි ත්‍රස්තවාදී කඳවුරු ගෝලීය ත්‍රස්තවාදයේ විශ්ව විද්‍යාල වැනියි. 9/11 ප්‍රහාරය සහ ලන්ඩන් ටියුබ් බෝම්බ ප්‍රහාරය වැනි ලෝකයේ දරුණු

ත්‍රස්තවාදී ප්‍රහාර සහ පසුගිය දශක කිහිපය තුළ ඉන්දියාව තුළ සිදුවූ දරුණු ත්‍රස්තවාදී ප්‍රහාර කවරකාරයෙන් හෝ මෙම ත්‍රස්ත තිප්පොළවල් වෙත සම්බන්ධයි. ත්‍රස්තවාදීන් අපගේ සහෝදරියන්ගේ නළලත සින්දූර් මකා දැමුවා. ඉන්දියාව ඔවුන්ගේ ත්‍රස්තවාදී මූලස්ථාන විනාශ කර ප්‍රතිචාර දැක්වූවා. මෙම ප්‍රහාරයන් හිදි භයානක ත්‍රස්තවාදීන් 100කට අධික පිරිසක් ඉන්දියාව විසින් මරා දමා තිබෙනවා. ඉන්දියාවට එරෙහිව කුමන්ත්‍රණය කළ ත්‍රස්තවාදීන් පසුගිය දශක දෙක හමාර - තුන පුරා පාකිස්ථානය තුළ නිදහසේ සැරිසරමින් සිටියා. ඉන්දියාව එක් ප්‍රහාරයකින්ම ඔවුන් මරා දැමුමා.

මිත්‍රවරුනි,

පාකිස්ථානය ඉන්දියාවේ මෙම ක්‍රියාමාර්ග හමුවේ දැඩි අපේක්ෂාභංගත්වයකට පත් වුණා. එය වික්ෂිප්තභාවයට පත් වුණා. මෙම වික්ෂිප්තභාවය තුළ එය තවත් බියගුලු ක්‍රියාවක් සිදු කළා. ත්‍රස්තවාදයට එරෙහි ඉන්දියාවේ ප්‍රහාරයට සහයෝගය දක්වනවා වෙනුවට පාකිස්ථානය ඉන්දියාවට පහර දීමට පටන් ගත්තා. පාකිස්ථානය අපගේ පාසල්, විද්‍යාල, ගුරුද්වාර, කෝවිල් සහ සිවිල් වැසියන්ගේ නිවාස ඉලක්ක කර ප්‍රහාර එල්ල කළා. පාකිස්ථානය අපගේ හමුදා කඳවුරු ඉලක්ක කරගෙන ප්‍රහාර එල්ල කළා. නමුත් මෙම ක්‍රියාමාර්ග හමුවේ දුර්මුඛ වූයේ පාකිස්ථානයමයි. ඉන්දියාව හමුවේ පාකිස්ථානයේ ඩ්‍රෝන සහ මිසයිල පිදුරු ගස් මෙන් කඩා වැටෙන ආකාරය ලෝකය දුටුවා. ඉන්දියාවේ ශක්තිමත් ගුවන් ආරක්ෂණ පද්ධතිය ඒවා ගුවනේදීම විනාශ කළා. පාකිස්ථානය දේශසීමාව මත ප්‍රහාරයකට සූදානම්ව සිටියා. නමුත් ඉන්දියාව පාකිස්ථානයේ හදවතටම පහර දුන්නා. ඉන්දියාවේ ඩ්‍රෝන සහ මිසයිල නිරවද්‍යතාවයෙන් යුත් ප්‍රහාර එල්ල කළා. ඒවා පාකිස්ථානය මහත් ආඩම්බරයෙන් සිටි පාකිස්ථාන ගුවන් හමුදා කඳවුරු විනාශ කළා. පාකිස්ථානය කිසිදා නොසිතූ පරිදි ඉන්දියාව පළමු දින තුන තුළම පාකිස්ථානයට දරුණු හානියක් සිදු කළා. ඉන්දියාවේ ආක්‍රමණශීලී ක්‍රියාමාර්ග හමුවේ පාකිස්ථානය ගැලවී යන්නට මාර්ග සොයන්නට පටන් ගත්තා. ආතතීන් සමනය කරන ලෙස පාකිස්ථානය ලොවට ආයාචනා කළා. දරුණු විනාශයන්ට මුහුණ දීමෙන් අනතුරුව පාකිස්ථානය මැයි 10 වන දින පස්වරුවේ අපගේ හමුදා මෙහෙයුම් අධ්‍යක්ෂ ජනෙරාල්තුමා (DGMO) හා සම්බන්ධ වුණා. ඒ වන විට අප ත්‍රස්තවාදයේ යටිතල පහසුකම් විශාල ලෙස විනාශ කර තිබුණා. ත්‍රස්තවාදීන් මරා දැමුණා. අප පාකිස්ථානයේ හදවතේ ස්ථාපනය කර තිබූ ත්‍රස්තවාදී කඳවුරු විනාශ කර තිබුණා. එබැවින්, පාකිස්ථානය ආයාචනා කර තවදුරටත් ත්‍රස්තවාදී හෝ හමුදා ක්‍රියාමාර්ග නොගන්නා බව පැවසූ විට ඉන්දියාව එය සලකා බැලුවා. මම නැවතත් අවධාරණය කරනවා, අප පාකිස්ථානයේ ත්‍රස්තවාදී සහ හමුදා කඳවුරු වලට එරෙහි ප්‍රතිචාරාත්මක ක්‍රියාමාර්ග තාවකාලිකව නතර කර තිබෙනවා පමණයි. අප ඉදිරි දිනවලදී පාකිස්ථානය ඉදිරියේදී කවර ආකල්පයක් දරන්නේ ද යන නිර්ණායකය මත පාකිස්ථානයේ සෑම පියවරක්ම තක්සේරු කරනවා.

මිත්‍රවරුනි,

ඉන්දියාවේ ත්‍රිවිධ හමුදාව - අපගේ ගුවන් හමුදාව, යුධ හමුදාව සහ නාවික හමුදාව, අපගේ දේශසීමා ආරක්ෂක බලකාය - BSF , ඉන්දියාවේ පැරාමිලිටරි බලකායන් නිරන්තර අවධානයෙන් පසු වෙනවා. අපගේ නිශ්චිත ඉලක්කගත ප්‍රහාර සහ ගුවන් ප්‍රහාරයන්ගෙන් අනතුරුව, සින්දූර් මෙහෙයුම, දැන් ත්‍රස්තවාදයට එරෙහිව ඉන්දියාවේ ප්‍රතිපත්තිය යි. සින්දූර් මෙහෙයුම ත්‍රස්තවාදයට

එරෙහි අපගේ සටනේ නව මිනුම් ලකුණක් නිර්මාණය කර තිබෙන අතර එය නව පරාමිතියක් සහ සාමාන්‍ය තත්ත්වයක් ගොඩ නගා තිබෙනවා.

පළමුව, ඉන්දියාවට එරෙහිව ත්‍රස්තවාදී ප්‍රහාරයක් සිදු වන්නේ නම් එයට සුදුසු පිළිතුරක් ලබා දෙනු ඇති.

අප අපගේ කොන්දේසි මත පමණක්ම වන සුදුසු ප්‍රතිචාරයක් ලබා දෙනවා. ත්‍රස්තවාදයේ මුල් මතුවන සියලු ස්ථානයන්හි අප දැඩි පියවර ගන්නවා.

දෙවනුව, ඉන්දියාව කිසිදු න්‍යෂ්ටික බියගැන්වීමක් නොඉවසනු ඇති. ඉන්දියාව න්‍යෂ්ටික බියගැන්වීම්වල ආවරණය යටතේ වර්ධනය වන ත්‍රස්තවාදී තිප්පොළවල් වෙත නිරවද්‍ය ලෙස සහ දැඩි ලෙස පහර දෙනු ඇති.

තෙවනුව, අප ත්‍රස්තවාදයට අනුග්‍රහය දක්වන රජය සහ ත්‍රස්තවාදයේ මහ මොළකරුවන් එකිනෙකින් වෙනස් ලෙස දකින්නේ නැහැ. සින්දූර් මෙහෙයුම අතරතුර මරා දමන ලද ත්‍රස්තවාදීන්ට අවසන් ගෞරව දැක්වීමට පාකිස්ථානයේ ඉහළ හමුදා නිලධාරීන් පැමිණි අවස්ථාවේදී ලෝකය නැවත වතාවක් පාකිස්ථානයේ අවලස්සන මුහුණ දුටුවා. මෙය රාජ්‍ය අනුග්‍රහය සහිත ත්‍රස්තවාදය පිළිබඳ ශක්තිමත් සාක්ෂියක් ඕනෑම තර්ජනයකින් ඉන්දියාව සහ අපගේ පුරවැසියන් ආරක්ෂා කිරීම සඳහා අප තවදුරටත් අඛණ්ඩව දැඩි පියවර ගන්නවා.

මිත්‍රවරුනි,

අප යුධ පිටිය තුළ සෑම අවස්ථාවකම පාකිස්ථානය පරාජය කර තිබෙනවා. මෙම අවස්ථාවේදී, සින්දූර් මෙහෙයුම නව මානයක් එක් කර තිබෙනවා. අප කාන්තාරයන්හි ද කඳු ශිඛරයන්හි ද අපගේ හැකියාවන් ප්‍රදර්ශනය කර තිබෙන අතර නව යුගයේ යුධ ගැටුම්හි අපගේ උසස්භාවය ද ඔප්පු කර තිබෙනවා. මෙම මෙහෙයුම අතරතුර ඉන්දියාව විසින් නිෂ්පාදිත අවිවල විශ්වාසනීයත්වය ද ඔප්පු කෙරුණා. 21 වන සියවසේ යුධ ගැටුම් තුළ ඉන්දියාව විසින් නිෂ්පාදිත ආරක්ෂක උපකරණ සඳහා කාලය පැමිණ ඇති බව වර්තමානයේ දී ලෝකය දකිමින් තිබෙනවා.

මිත්‍රවරුනි,

අපගේ විශාලම ශක්තිය වන්නේ ත්‍රස්තවාදයේ සියලු ආකාරයන්ට එරෙහි අපගේ එක්සත්භාවය යි. මෙය නිසැකයෙන්ම යුද්ධයේ යුගය නොවේ. නමුත් මෙය ත්‍රස්තවාදයේ යුගය ද නොවේ. වඩා යහපත් ලෝකයක් සඳහා සහතිකය වන්නේ ත්‍රස්තවාදය කිසි ලෙසකින්වත් නොඉවසීම යි.

මිත්‍රවරුනි,

පාකිස්ථාන හමුදාව, පාකිස්ථානය ත්‍රස්තවාදයට දිරිදෙන ආකාරය දෙස බලන විට ත්‍රස්තවාදය දිනෙක පාකිස්ථානය විනාශ කරනු ඇති. පාකිස්ථානයට නොනැසී සිටිය යුතු නම්, එය ත්‍රස්තවාදී යටිතල පහසුකම් විනාශ කළ යුතුයි. සාමය සඳහා අන් මඟක් නැහැ. ඉන්දියාවේ ස්ථාවරය ඉතා පැහැදිලියි...

ත්‍රස්තවාදය සහ සාකච්ඡාවන්ට එකට යා නොහැකියි... ත්‍රස්තවාදය සහ වෙළෙඳාමට එකට යා නොහැකියි... ජලය සහ රුධිරයට එක්ව ගලා යා නොහැකියි.

පාකිස්ථානය සමඟ සාකච්ඡා පැවැත්වෙන්නේ නම් ඒ ත්‍රස්තවාදය පිළිබඳව පමණක් බවත්; පාකිස්ථානය සමඟ සාකච්ඡා පැවැත්වෙන්නේ නම් ඒ පාකිස්ථානය විසින් පාලනය කරන කාශ්මීරය (PoK) පිළිබඳව පමණක් බවත් අප විසින් ප්‍රකාශයට පත් කර තිබෙන ප්‍රතිපත්තිය බව අද දින මා ගෝලීය ප්‍රජාවට ප්‍රකාශ කිරීමට ද කැමතියි.

හිතවත් රටවැසියනි,

අද වෙසක් පොහෝ දිනයයි. බුදුන් වහන්සේ අපට සාමයේ මාවත පෙන්වා දී තිබෙනවා. සාමයේ මාවත බලය තුළින් ද ගමන් කරනවා. මනුෂ්‍යත්වය සාමය සහ සෞභාග්‍යය කරා ගමන් කළ යුතුයි. සෑම ඉන්දියානුවකුට ම සාමයෙන් ජීවත් විය හැකි සහ විකසිත භාරතයක (සංවර්ධිත ඉන්දියාවක්) සිහිනය ළඟා කර ගත හැකි විය යුතුයි. මේ සඳහා ඉන්දියාව බලවත් වීම ඉතාමත් අවශ්‍යයයි. එසේම, මෙම බලය අවශ්‍ය විට භාවිතා කිරීමත් අවශ්‍යයි. පසුගිය දින කිහිපය තුළ ඉන්දියාව සිදු කළේ එයයි.

නැවත වතාවක් මා ඉන්දීය හමුදාවන්ට සහ සන්නද්ධ බලකායන්ට ආචාර කරනවා. සෑම ඉන්දියානුවකුගේම ධෛර්යයට, ඉන්දියාවේ ජනතාවගේ සපථ කිරීමට සහ අධිෂ්ඨානයට මා හිස නමා ආචාරය පුද කරනවා.

ස්තුතියි,

භාරත් මාතා කි ජයේ!!!

භාරත් මාතා කි ජයේ!!!

භාරත් මාතා කි ජයේ!!!

**විශේෂ සටහන:** මෙය අග්‍රාමාත්‍යතුමාගේ කතාවේ දළ සිංහල පරිවර්තනයයි**.** එතුමාගේ කතාව හින්දි භාෂාවෙන් සිදු කරන ලදී**.**